# නපුරු කොරෝනාවෙන් පාඩමක්



සෙනුලි අහස්නා බණ්ඩාර

# තපුරු කොරෝනාවෙන් පාඩමක්

සෙනුලි අහස්නා බණ්ඩාර

# පිදුම

ආදරණීය විදුහල්පතිතුමියටත්,

අකුරු කියාදෙන පන්තිභාර ගුරුතුමියටත්,

පොත් ලිවීම සඳහා උපදෙස් ලබාදුන් සියලුම ගුරු දෙමාපියන්ටත්,

මාගේ දෙමාපියන්ටත්,

මෙම පොත පුද කරමි.

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය  මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් ‘‘දිවිය දිනන විද්‍යුත් පොතක්‘‘ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ ‘‘දිවිය දිනන විද්‍යුත් පොතක්‘‘ ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණ අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.


මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.


ශෂිකලා සේනාධීර,
විදුහල්පතිණිය,
මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023.10.20



“එකමත් එක දවසක නරක යාළුවෝ කිහිපදෙනෙක් අපේ ලෝකයට ආවා. දන්නවද යාළුවේ ඇයි ඒ කියලා? අපේ මිනිස්සු කරන නරක වැඩ බලන්න. අපේ ලෝකේ රටවල් ගොඩක් තියෙනවා, ගස් වර්ග ගොඩක් තියනවා.

අපේ ලෝකේ මිනිස්සු මේ ගස් වලට කරදර කරනවා. මිනිස්සුන්ට ඉන්න ඕන පුංචි ඉඩක් උනත් ගස් කපලා ලොකු ඉඩක් හොයනවා. ගස් අඩුවෙනකොට අපිට හොඳ හුස්මක් නැතිවෙනවා, වැස්ස අඩුවෙනවා, වතුර නැති වෙනවා.





ඒ මදිවට විනෝදයට කැලේ ඉන්න සත්තු මරනවා. සත්තු ඔක්කොම නැති උනොත් අපිට පාළුයි. ඇත්තටම මේ මිනිස්සු සත්තු, ගස් ඔක්කොම අයිති "ලෝකයට". මිනිස්සුන්ට ඒක අමතක උනාට ලෝකයට ඒක හොඳට මතකයි.

දැන් නම් බලන් හිටියා ඇති,
“නරක යාළුවෝ හිතුවා“ මේ ලෝකයට හොඳ පාඩමක් උගන්වන්න පුළුවන් වෛරසයක් ගේන්න ඕනි කියලා. එහෙම හිතපු යාළුවෝ ටික භයානක වෛරසයක් මේ ලොකේට ගෙනාවා.



අපි ගෙනාපු වෛරසය භයානකයි. මිනිස්සු ඒ වෛරසයට “කොරෝනා“ කියලා මිනිස්සු නමකුත් දාලා. ඒ වෛරසය මිනිස්සුන්ගේ ඇඟ ඇතුලට ගිහින් අසනීප කරවනවා.



හැබැයි අපි කොරෝනා ගෙනාවේ නරක මිනිස්සුන්ට, ඒත් හොඳ මිනිස්සුත් ලෙඩ වුණා. ඒකට අපට සමාවෙන්න.



හැබැයි හොඳ මිනිස්සුන්ට පුළුවන් අපිව පරදවන්න. මීටරයේ දුරින් ඉදලා "මාස්ක්" දාලා සැනිටයිසර් ගාලා හොඳ පුරුදු තියන අයට වෛරසය එළවන්න පුළුවන්.



ලෙඩ්ඩුගෙන් ඇත් වෙලා අත හොඳට හෝදලා හිටියොත්, සෙරෙප්පු අව්වට දාලා, හොඳට කෑම කාලා වතුර ගොඩක් බීලා, අතේ දුරින් ඉඳලා කොරොනා පරද්දවපු අයත් හිටියා.




අපි නිසා මිනිස්සු ගෙදරම අවුරුදු දෙකක් හිටියා. එළියටවත් ආවේ නෑ. සත්තු ඔක්කොම එළියට ආවා. ගස් වැල් කැලේ සරුවට හැදුනා. කුරුල්ලන් සතුටින් ඉගිලුනා. ගංගා නිල් පාටයි ඒවට කුණු දාන්න කවුරුත් නෑ. අපි කෑඩු වුණා. පරිසරය නිදහසේ සතුට සැමරුවා.



නපුරු යාළුවෝ ගෙනාපු වෛරසය නිසා මිනිස්සු කවදාවත් අමතක නොවන හොඳ පාඩමක් ඉගෙන ගත්තා. හොඳ පුරුදු පුරුදු වුණා. අනිත් අයට උදව් කරන්න පුරුදු වුණා. අන්තිමට මිනිස්සු ඒ භයානක වෛරසය පරාජය කළා.

ලෝකයට පාඩමක් කියා දුන්නු නපුරු යාළුවොත් ආපහු එයාලගේ ලෝකෙටම අපහු යන්න පිටත් වුණා.





පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී.

ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට තාක්ෂණය හා බැදුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20

ISBN: 9 7-8-6242 -066-6

9 786242 066615